මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/01/01/08/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.03.22

**අයවැය චක්‍රලේඛ අංක: 01/2025**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**2025 අංක 03 දරණ විසර්ජන පනත යටතේ 2025 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය**

**01. වියදම් දැරීම සඳහා අධිකාරී බලය**

2025 මුදල් වර්ෂය සඳහා වියදම් දැරීමට අධිකාරී බලය ලබා දෙමින්, 2025 අංක 03 දරන විසර්ජන පනත 2025.03.21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

2025 වර්ෂයේ රජයේ වියදම් දැරීම සඳහා ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ඉවත් කර ගැනීමට අදාළ වූ අධිකාරී බලපත්‍ර සඳහා මුදල් විෂයය භාර අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත. ඒ අනුව, 2025 වර්ෂය තුළ ගෙවීම් වවුචර්පත් හා අදාළ වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළ යුතු වේ.

| | | |
|---|---|---|
| (අ). සාමාන්‍ය පොදු සේවා සඳහා | - | 2025 අංක 1 දරන සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය |
| (ආ). විශේෂ නීති සේවා සඳහා | - | 2025 අංක 1 දරන විශේෂ නීති අධිකාරී බලපත්‍රය |
| (ඇ). අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා | - | 2025 අංක 1 දරන අත්තිකාරම් බලපත්‍රය |

**02. රජයේ වියදම් සම්බන්ධයෙන් වන කළමනාකරණ වගකීම**

සියලුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් තමා යටතේ වන ආයතනවල මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාට වගකිව යුතු වේ. අයවැය මගින් ඉලක්කගත කාර්යයන් සහ ප්‍රතිඵල, වර්ෂය තුළ සපුරාලීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ, ගණන්දීමේ නිලධාරීන්ගේ මෙන්ම විෂයභාර නිලධාරීන්ගේ ද වගකීමක් වේ. විශේෂයෙන් මූලධන සංවර්ධන ව්‍යාපෘති සහ සුබසාධන වැඩසටහන් යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. නිරන්තර පසු විපරම සහ ඉක්මන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග තුළින් වාර්ෂික ඉලක්ක සපුරා ගැනීමට වගබලා ගත යුතු වේ.

කෙසේ වුව ද, අයවැය ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව ඇති කර ගනු ලබන බැදීම් සඳහා භාණ්ඩාගාරයේ වගකීමක් නොමැති බැවින් එවැනි වියදම් සඳහා අදාළ නිලධාරීන් පෞද්ගලිකව වගකිව යුතු වේ.

**03. 2025 වර්ෂයේ රජයේ වියදම් කළමනාකරණය**

03.1 රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධයෙන් වන විධිවිධාන විස්තීරණව දක්වමින් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි වියදම් පාලන උපදෙස් සහ දැනට වලංගුව පවතින අනෙකුත් චක්‍රලේඛවල සෙසු වියදම් පාලන උපදෙස් කෙරෙහි දැඩි අවධානය යොමු කරමින් කටයුතු කළ යුතු වේ.

03.2 බැඳීම් කළමනාකරණය පහසුවනු පිණිස 2025 වර්ෂය සඳහා ද රු. මිලියන 500 ට වැඩි හෝ වර්ෂ කිහිපයක් තුළ ගෙවීම් කිරීමට සිදුවන ආකාරයේ මුළු පිරිවැය රු. මිලියන 1,000 ට වැඩි ප්‍රාග්ධන වියදම් අයිතම සම්බන්ධයෙන් වගකීම්වලට එළැඹීමට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහි එකඟතාවය ලබා ගත යුතු වේ.

03.3 යම් අත්‍යවශ්‍ය කාරණයක් සඳහා පමණක් අතිරේක ප්‍රතිපාදන ඉල්ලා සිටින අවස්ථාවල දී, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශය සහිතව එම ඉල්ලීම් මහා භාණ්ඩාගාරය වෙත යොමු කළ යුතු වේ. අතිරේක ප්‍රතිපාදන සඳහා වන ඉල්ලීම් 2025 මුද්‍රිත විස්තරාත්මක අයවැය ඇස්තමේන්තුවල පූර්විකාවේ දක්වා ඇති පදනම්/හේතු කාරණාවලට පමණක් සීමා විය යුතු වේ.

03.4 වීරමොන් ක්‍රියාපටිපාටිය යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් සඳහා ඉල්ලුම් කරන අවස්ථාවලදී ප්‍රතිපාදන ඌණතාවය සහ ඉතිරිවීම් ජනනය වීමට හේතු ප්‍රමාණවත්ව සහ පැහැදිලිව සඳහන් කළ යුතු වේ. එම ඉල්ලීම් 2025.12.31 දිනට ප්‍රථම ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ නිළධාරීන් වෙත යොමු කළ යුතු වේ.

03.5 2025.12.31 දිනට පසුව මුදල් රෙගුලාසි 69 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම සිදුකළ හැක්කේ ඒ වන විටත් ප්‍රතිපාදන ඉක්මවා ගෙවීම් කර ඇති අවස්ථාවල දී පමණක් වන අතර, මුදල් රෙගුලාසි 69හි දක්වා ඇති පරිදි පූර්ව අධිකාරී බලය ලබා නොගැනීමට හේතු වූ කරුණු පැහැදිලිව පිළිගත හැකි පරිදි ඉදිරිපත් කර නොතිබේ නම්, එවැනි මාරු කිරීම් අනුමත නොකරන බවද අවධාරණය කරමි.

03.6 රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් තම විෂයපථයට අයත් කාර්යයන් වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා සිදුකර ගැනීමේ දී එම කාර්යය ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි අදාළ මුදල් වර්ෂයේ අවසාන කාර්තුවට ප්‍රථම මුදල් රෙගුලාසි 208 යටතේ අයවැය ප්‍රතිපාදන පවරා දීම සිදුකළ යුතු වේ.

03.7 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි 53 වගන්තිය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි අයවැය ඇස්තමේන්තුවල ප්‍රාග්ධන වියදම් සමබන්ධයෙන් විධිවිධාන සළසන නියෝග සාදන තෙක් ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් ප්‍රාග්ධන වියදම් දැරීමට මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීම සඳහා වන ඉල්ලීම් 2025.04.07 දිනට ප්‍රථම මහාභාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ.

## 04. 2025 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

04.1 2025 අයවැය මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත වියදම් යෝජනා මගින් අපේක්ෂිත ප්‍රතිඵල නියමිත කාලරාමුව තුළ මහජනතාව වෙත ලබාදීම සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පළමුව වියදම් යෝජනා සම්බන්ධයෙන් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක MNPEA/02/2019 හා 2019.01.10 දිනැති චක්‍රලේඛයෙහි දැක්වෙන ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය (Project Submission Format) අනුව අදාළ ව්‍යාපෘති යෝජනා (Project proposals) සකස් කර එම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර, අවශ්‍ය අනුමැතීන් කඩිනමින් ලබාගත යුතු වේ.

04.2 ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් විසින් වියදම් යෝජනා ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය සහ පසුවිපරම මෙන්ම සම්බන්ධීකරණය ද සිදු කිරීමට නියමිත වේ. එහිදී, වියදම් යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මාසිකව සමාලෝචනය කිරීමට නියමිත අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කාලානුරූපව එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන උපදෙස් අනුව ඉදිරිපත් කළ යුතු වේ.

04.3 රාජ්‍ය අංශයේ වැටුප් වැඩිවීම, විශ්‍රාම වැටුප් සංශෝධනය සහ රාජ්‍ය සේවකයන්ගේ ආපදා ණය සීමාව ඉහළ නැංවීම පිළිබඳව වූ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාළ චක්‍රලේඛ/මාර්ගෝපදේශ යථා කාලයේ දී රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ඇත.

04.4 යෝජිත ආපදා ණය හිමිකම් සීමාව ඉහළ නැංවීම පිළිබඳව අවධානය යොමුකර 2025 සඳහා වන "අත්තිකාරම් බී ගිණුම්වල" උපරිම වියදම් සීමාවන් නිර්ණය කර ඇති අතර විසර්ජන පනත මගින් නියම කර ඇති උපරිම වියදම් සීමාවන් තවදුරටත් වැඩි කිරීමට වන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. එබැවින්, පවත්නා සීමාවන් ඉක්මවා නොයන පරිදි සහ වර්ෂය තුළ ණය ලබා දීම් සිදු කිරීමට හැකි වන පරිදි, සුදුසු ප්‍රමුඛතා අනුපිළිවෙළක් ආයතන විසින් සකස් කළ යුතු වේ.

**05. අතුරු සම්මත ගිණුම අහෝසි වීම හා විසර්ජන පනත බලාත්මක වීම**

2024.12.06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද අතුරු සම්මත ගිණුම මඟින් ඒ ඒ වැය විෂය යටතේ වෙන් කර තිබුණු ප්‍රතිපාදන ද ඇතුළත් කරමින් 2025 අංක 03 දරන විසර්ජන පනත සකස් කර ඇත. ඒ අනුව, 2025 සම්පූර්ණ මුදල් වර්ෂය තුළ අයවැය අස්ථිත්වයන් මඟින් දරනු ලබන වියදම්, මෙම පනතේ විධිවිධාන පරිදි විය යුතු වේ.

ඒ අනුව, අත්තිකාරම් ගිණුම් කටයුතු යටතේ දරන ලද වියදම් හා අතිරේක ප්‍රතිපාදන ද ඇතුළත්ව අතුරු සම්මත ගිණුම යටතේ 2025.01.01 දින සිට මේ දක්වා දරන ලද සියලු වියදම්, 2025 අංක 03 දරන විසර්ජන පනත යටතේ දරන ලද වියදම් ලෙස සැලකිය යුතු වේ.

එසේම, 2025.01.01 සිට 2025.03.21 දින දක්වා නිකුත් කරන ලද බල අංක 01/2025 සිට 21/2025 දක්වා වන අතිරේක ප්‍රතිපාදන, 2025 අංක 03 දරන විසර්ජන පනතේ 06 (1) වගන්තිය යටතේ ලබා දුන් අතිරේක ප්‍රතිපාදන ලෙස සලකනු ලැබේ. 2025 වර්ෂයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී ඇතැම් අතිරේක ප්‍රතිපාදන නිකුත් කිරීම් ද ඇතුළත් කර වාර්ෂික වියදම් සීමාවන් නිර්ණය කර ඇති අවස්ථාවලදී ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් පෙර නිකුත් කරන ලද අතිරේක ප්‍රතිපාදන ලිපි අවලංගු කිරීමට කටයුතු කරනු ඇත. එවන් අවස්ථාවලදී අතිරේක ප්‍රතිපාදන භාවිත කරමින් දරන ලද වියදම් 2025 වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන යොදා ගනිමින් දරන ලද වියදමක් සේ සලකනු ඇත.

තවද, 2024.12.06 දින සම්මත කරන ලද අතුරු සම්මත ගිණුම මඟින් සලසන ලද ප්‍රතිපාදනවල යම් ඉතිරියක් වේ නම් එය තවදුරටත් වලංගු නොවනු ඇත.

**06. පැහැදිලි කරගැනීම**

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් අවශ්‍ය පැහැදිලි කර ගැනීම්, ඇමුණුම් 01 හි දක්වා ඇති ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය පිළිබඳ වගකීම දරන නිලධාරියා හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (011-2484681) මගින් ලබා ගත හැකි ය.

**කේ. එම්. මහින්ද සිරිවර්ධන**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව

Annexure I

## List of Officers in Charge of Operations in Budget Estimates of Ministry/Sector — 2025

| Ministry/Sector | In-Charge Officer Name | Designation | Phone No. | Email |
|---|---|---|---|---|
| Special Spending Units | Ms. Anjalika Gunasekara | Director | 011-2484688 (Ext -1337) | gunasekera.ak@nbd.treasury.gov.lk |
| Buddhasasana, Religious and Cultural Affairs | Ms. Sanjeewani Weerasekara | Director | 011-2484685 (Ext -1308) | weerasekara.wmsk@nbd.treasury.gov.lk |
| Finance, Planning and Economic Development | Mr. Nirmana Mohotty | Assistant Director | 011-2484740 (Ext -1115) | mohotty.mmmn@nbd.treasury.gov.lk |
| Defence | Ms. P.D. Lakshika Senarathna | Director | 011-2034429 (Ext -4346) | senarathna.pdlp@nbd.treasury.gov.lk |
| Justice and National Integration | Ms. H.R.Sandamali | Assistant Director | 011-2432848 (Ext -1774) | sandamali.hr@nbd.treasury.gov.lk |
| Health and Mass Media | Ms. H.L.J.K. Amarasekara | Deputy Director | 011-2484667 (Ext -1302) | amarasekara.hljk@nbd.treasury.gov.lk |
| Foreign Affairs, Foreign Employment and Tourism | Mr. Viraj Wijewardana | Director | 011-2484677 (Ext -1313) | wijewardhana.hrvp@nbd.treasury.gov.lk |
| Trade, Commerce, Food Security and Co-operative Development | Mr. Herath Banda | Director | 011-2484894 (Ext -1008) | banda.jmh@nbd.treasury.gov.lk |
| Transport, Highways, Ports and Civil Aviation | Mr. Prakrama Thennakoon | Deputy Director | 011-2484858 (Ext -1279) | thennakoon.tmdp@nbd.treasury.gov.lk |
| Agriculture, Livestock, Land and Irrigation | Ms. Udeshika Wijerathne | Assistant Director | 011-2484760 (Ext -1326) | wijerathna.gguk@nbd.treasury.gov.lk |
| Energy | Ms. Punya Rajapaksha | Deputy Director | 011-2484581 (Ext -1010) | rajapaksha.rap@nbd.treasury.gov.lk |
| Urban Development, Construction and Housing | Mr. Herath Banda | Director | 011-2484894 (Ext -1008) | banda.jmh@nbd.treasury.gov.lk |
| Rural Development, Social Security and Community Empowerment | Mr. Viraj Wijewardana | Director | 011-2484677 (Ext -1313) | wijewardhana.hrvp@nbd.treasury.gov.lk |
| Rural Development, Social Security and Community | Mr. Viraj Wijewardana | Director | 011-2484677 (Ext -1313) | wijewardhana.hrvp@nbd.treasury.gov.lk |
| Higher Education and Vocational Education | Ms. G.D.M.M. Gunarathna | Deputy Director | 011-2034505 (Ext -1720) | gunasekara.gdmm@nbd.treasury.gov.lk |
| Public Administration and District Secretariat | Mr. M.J.M. Ifham | Director | 011-2484687 (Ext -1322) | ifham.mjm@nbd.treasury.gov.lk |
| Provincial Councils and Local Government | Ms. H.R. Sandamali | Assistant Director | 011-2432848 (Ext -1774) | sandamali.hr@nbd.treasury.gov.lk |
| Plantation and Community Infrastructure | Ms. Udeshika Wijerathne | Assistant Director | 011-2484760 (Ext -1326) | wijerathna.gguk@nbd.treasury.gov.lk |
| Industry and Entrepreneurship Development | Mr. Rasika wijekoon | Director | 011-2484677 (Ext -1313) | wijewardhana.hrvp@nbd.treasury.gov.lk |
| Fisheries Aquatic and Ocean Resources | Ms. Chandrika Senanayake | Director | 011-2484579 (Ext -1151) | senanayake.c@nbd.treasury.gov.lk |
| Environment | Ms. Chandrika Senanayake | Director | 011-2484579 (Ext -1151) | senanayake.c@nbd.treasury.gov.lk |
| Women and Child Affairs | Mr. Sudarshana De Silva | Director | 011-2484668 (Ext -1316) | silva.ksm@nbd.treasury.gov.lk |
| Digital Economy | Mr. Rasika wijekoon | Director | 011-2484690 (Ext -1324) | wijekoon.wmr@nbd.treasury.gov.lk |
| Public Security and Parliamentary Affairs | Mr. Kumara Senanayake | Director | 011-2151457 (Ext -2306) | senanayake.prk@nbd.treasury.gov.lk |
| Labour | Ms. G.D.M.M. Gunarathna | Deputy Director | 011-2034505 (Ext -1720) | gunasekara.gdmm@nbd.treasury.gov.lk |
| Youth Affairs and Sports | Mr. Sudarshana De Silva | Director | 011-2484668 (Ext -1316) | silva.ksm@nbd.treasury.gov.lk |
| Science and Technology | Ms. T.H.J. Priyanka | Deputy Director | 011-2151456 (Ext -2027) | priyanka.thj@nbd.treasury.gov.lk |
| Advance Account Activities | Mr. Kumara Senanayake | Director | 011-2151457 (Ext -2306) | senanayake.prk@nbd.treasury.gov.lk |
| Budget Process Management | Mr. Saman Senarathne | Director | 011-2484515 (Ext -1625) | senarathna.sc@nbd.treasury.gov.lk |